ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2024 (2025 ජනවාරි)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025 ஜனவரி)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2024 (January 2025)

| | | |
|---|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II<br>வணிகக் கல்வியும் கணக்கீடும் I, II<br>**Business and Accounting Studies I, II** | 10 ශ්‍රේණිය<br>*Grade 10* | පැය තුනයි<br>*Three hours* |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.
**Additional Reading Time - 10 minutes**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**උපදෙස් :**

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

❖ පහත සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්ණ අංක 01 සිට 04 දක්වා පිළිතුරු සපයන්න.

නවීන තාක්ෂණික ක්‍රම උපයෝගි කරගෙන කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා ඇති "අරුංපොල" ඉවතලන ද්‍රව්‍ය භාවිතයෙන් කාබනික පොහොර නිෂ්පාදනය කරයි. ප්‍රමාණවත් ඉඩම් හිමියෙකු වන ඔහු ව්‍යාපාරික වශයෙන් කාබනික පොහොර නිපදවන්නේ ය. එළවලු හා මල් වගා කරන ප්‍රදේශයක මෙම නිෂ්පාදනාගාරය පිහිටුවා තිබිම ඔහුට වාසිදායක විය.

01. මෙම සිද්ධියේ සඳහන් අරුංපොලගේ ව්‍යාපාරය,
  **(i)** භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි. **(ii)** සේවා සපයන ව්‍යාපාරයකි.
  **(iii)** හවුල් ව්‍යාපාරයකි. **(iv)** ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.

02. අරුංපොලගේ ව්‍යාපාරයේ ශක්තියක් වන්නේ,
  **(i)** අරුංපොල විශේෂ පුහුණුවක් ලබා තිබිම ය.
  **(ii)** අරුංපොලට ඉලක්ක වෙළෙඳ පොලක් පැවතීම ය.
  **(iii)** අවට ඉවතලන ද්‍රව්‍ය බොහෝ ප්‍රමාණයක් පැවතිම
  **(iv)** කාබනික පොහොර භාවිතයට හුරු වූ ගොවීන් සිටීම ය.

03. අරුංපොල විසින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර අයත් වන නිෂ්පදාන සාධකය වන්නේ,
  **(i)** භූමිය **(ii)** ශ්‍රමය ය. **(iii)** ප්‍රාග්ධනය ය. **(iv)** ව්‍යවසායකත්ව ය.

04. ඉහත සිද්ධියට අදාල වන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
  **(i)** අරුංපොලගේ ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
  **(ii)** වාසනා, අරුංපොලගේ ව්‍යාපාරයේ හවුල් කරුවෙකි.
  **(iii)** ගොවීන් අරුංපොලගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයක් නොවේ.
  **(iv)** එළවළු වගා කරන ගොවීන් සිටින ප්‍රදේශයක් වීම, මෙම ව්‍යාපාරයට කදිම අවස්ථාවකි.

05. රජය ව්‍යාපාර කෙරෙහි මැදිහත්වන ආකාර හා ඊට නිදසුන් පහත දැක්වේ.

| | **X** තීරුව | | **Y** තීරුව |
|---|---|---|---|
| 1. | හිතකර දීරිගැන්වීම් ලබා දීම | **A** | විදුලිය, මහා මාර්ග |
| 2. | පාරිභෝගික ආරක්ෂාව | **B** | බදු සහන |
| 3. | පරිසරය සුරකීම | **C** | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය |
| 4. | යටිතල පහසුකම් | **D** | මධ්‍යම පරිසර අධිකාරිය |

ඉහත **X** තීරුවේ තොරතුරු **Y** තීරුවේ තොරතුරු සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,
  **(i) 1C, 2B, 3A, 4D** **(ii) 1A, 2B, 3C, 4D** **(iii) 1B, 2C, 3D, 4A** **(iv) 1D, 2C, 3B, 4A**

06. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක ලක්ෂණයක් වන්නේ,
(i) ස්පර්ශ කළ නොහැකි දෑ නිෂ්පාදනය කරයි. (ii) භෞතික පැවැත්මක් ඇති දෑ නිෂ්පාදනය කරයි.
(iii) වුවමනා සපුරාලන ක්‍රියාවක් හෝ ක්‍රියාවලියකි (iv) ගබඩා කර තබා ගත නොහැකි ය.

07. අයිතිකරුගේ නිර්මාණශීලිත්වය හා අවදානම් දැරීමට පසුබට නොවීම වැනි ලක්ෂණ අදාළ වන නිෂ්පාදන සාධකය වන්නේ,
(i) භූමිය (ii) ප්‍රාග්ධනය (iii) ව්‍යවසායකත්වය (iv) ශ්‍රමය

08. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම තුලින් හඳුනා ගත හැකි ව්‍යාපාර ශක්තීන් සඳහා උදාහරණයක් නොවන්නේ,
(i) ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම. (ii) පිළිගත් සන්නම් නාමයක් තිබීම.
(iii) සුවිශේෂී නිෂ්පාදන ක්‍රම. (iv) නව නගර නිර්මාණය.

09. අයිතිකරුගේ මූල්‍ය ශක්තිය, කුසලතා හා පළපුරුද්ද, ව්‍යාපාරය නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය, නිෂ්පාදනයට අදාළ වෙළෙඳ පොළ කොටස යන සාධක අදාළ වන්නේ,
(i) හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී
(ii) අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී
(iii) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී
(iv) සමාජ සුභ සාධනය පෙරදැරි කරගත් ව්‍යාපාරයක් ද යන්න තීරණය කිරීමේ දීය.

10. සඳුන් ලිපිද්‍රව්‍ය අලෙවිකිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. ඒ සම්බන්ධ ප්‍රකාශ හතරක් පහත දැක්වේ.
**A** - අයිතිකරුගේ වගකීම අසීමිත වේ.
**B** - අඛණ්ඩ පැවැත්මක් නොමැත.
**C** - නීතිමය පුද්ගලභාවයක් පවතී.
**D** - ලියාපදිංචිය අනිවාර්ය නොවේ.
ඒ අනුව සඳුන්ගේ ව්‍යාපාරය සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,
(i) **C** ප්‍රකාශය (ii) **D** ප්‍රකාශය (iii) **A** ප්‍රකාශය (iv) **B** ප්‍රකාශය

11. "මුතු" තමාගේ මල් පැල අලෙවි ව්‍යාපාරය ලියාපදිංචි කර පවත්වාගෙන යාමට අදහස් කරයි. ඇය මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුත්තේ,
(i) ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ (ii) 1890 හවුල් ව්‍යාපාර ආඥා පණත යටතේ
(iii) 2007 අංක 7 දරණ සමාගම් පණත යටතේ (iv) වංචා වැලක්වීමේ ආඥා පණත යටතේ

12. **A** - 2007 අංක 7 දරණ සමාගම් පණත **B** - 1890 හවුල් ව්‍යාපාර ආඥා පණත
**C** - 1972 අංක 5 දරණ සමූපාකාර සමිති පණත **D** - 1840 වංචා වැලැක්වීමේ ආඥා පණත
**E** - පළාත් සභා ව්‍යාපාර නාම ප්‍රඥප්තිය
මෙම තොරතුරු වලින් හවුල් ව්‍යාපාර වලට බලපාන පණත් වනුයේ,
(i) **ABC** පමණි. (ii) **ABCD** පමණි. (iii) **ABDE** පමණි (iv) **BCDE** පමණි.

13. රක්ෂණයට සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.
**A** - ස්වාමි පුරුෂයාට තම නිත්‍යානුකූල භාර්යාව රක්ෂණය කළ හැකිය.
**B** - රක්ෂණ දේපලකට වන්දි ලැබෙනුයේ හානිය යථා තත්වයට පත් කිරීමට පමණි.
**C** - රක්ෂිතයා හා රක්ෂකයා රක්ෂණ ගිවිසුමට අදාල සියලු තොරතුරු හෙළිදරව් කළ යුතුය.

ඉහත කරුණු වලට අදාල රක්ෂණ මූලධර්ම පිළිවෙලින් දැක්වෙන්නේ,
(i) රක්ෂණ හිමිකම, හානිපූරණය, උපරිම විශ්වාසය. (ii) උපරිම විශ්වාසය, හානිපූරණය, රක්ෂණ හිමිකම
(iii) රක්ෂණ හිමිකම, උපරිම විශ්වාසය, හානිපූරණය (iv) හානිපූරණය, උපරිම විශ්වාසය, රක්ෂණ හිමිකම

14. ප්‍රවාහනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(i) මහමාර්ග ප්‍රවාහනය ගමනාන්තය දක්වාම යොදා ගත නොහැක.
(ii) ගුවන් ප්‍රවාහනයේ දී බරින් අධික ද්‍රව්‍ය ප්‍රවාහනය කළ හැක.
(iii) දුම්රිය ප්‍රවාහනය නියමිත කාල සටහනකට අනුව සිදුවේ.
(iv) ප්‍රවාහන වියදම් ඉහල යාම භාණ්ඩ මිල ඉහල යාමට හේතු නොවේ.

15. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ කැළණි ගඟ හරහා නව පාළමක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ආරම්භ කර ඇත. මෙම ප්‍රකාශයේ සඳහන් ප්‍රවාහන පූලිකාංගය වන්නේ,
(i) මාර්ගය (ii) මාධ්‍යය (iii) බලය (iv) පර්යන්තය.

16. අභ්‍යන්තර සන්නිවේදන ක්‍රම පමණක් ඇතුළත් වාක්‍ය ඛණ්ඩය වන්නේ,
(i) ශබ්ද වාහිනි යන්ත්‍ර, ප්‍රවෘත්ති පත්‍ර, රැස්වීම්. (ii) රැස්වීම්, දැන්වීම් පුවරුව, වැඩමුළු
(iii) චක්‍රලේඛ, ගුවන් විදුලි, ලිපි (iv) රැස්වීම්, බැනර්, අන්තර් ජාලය.

17. "ව්‍යාපාරයක ලී බඩු ක්ෂය ගිණුම A වන අතර ගැනිලි ගිණුම B වේ."
ඉහත ප්‍රකාශයේ A හා B ස්ථාන වලට අදාළ ගිණුම් වන්නේ,
(i) වත්කම්, වියදම් (ii) වියදම්, ආදායම් (iii) වියදම්, හිමිකම් (iv) වත්කම්, හිමිකම්

❖ පහත තොරතුරු ඇසුරෙන් 18 හා 19 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| ගනුදෙනුව | | මූලික පොත. |
|---|---|---|
| 1. | රු. 4,000 ක භාණ්ඩ ණයට ගැනීම. | A - විකුණුම් ජ'නලය |
| 2. | රු. 16,000ක කාර්යාල උපකරණ ණයට ගැනීම | B - මුදල් පොත |
| 3. | රු. 17,000 ක භාණ්ඩ ණයට විකිණීම | C - ගැණුම් ජ'නලය |
| 4. | රු. 2,000 ක විදුලි බිලක් ගෙවීම | D - පොදු ජ'නලය |

18. ඉහත ගනුදෙනුව හා මූලික පොත් නිවැරදිව පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
(i) 1B, 2D, 3A, 4C (ii) 1A, 2B, 3D, 4C (iii) 1D, 2C, 3A, 4B (iv) 1C, 2D, 3A, 4B

19. ඉහත ගනුදෙනු සඳහා අවශ්‍ය මූලාශ්‍ර ලියවිලි පිළිවෙලින් නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
(i) ජ'නල් වවුචරය, ගැණුම් ඉන්වොයිසිය, විකුණුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය
(ii) ගැණුම් ඉන්වොයිසිය, වවුචරය, ජ'නල් වවුචරය, ලදුපත
(iii) ගැණුම් ඉන්වොයිසිය, ජ'නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය
(iv) ගැණුම් ඉන්වොයිසිය, විකුණුම් ඉන්වොයිසිය, ජ'නල් වවුචරය, ගෙවීම් වවුචරය

20. ගිණුම්වල සටහන් නොකරන නමුත්, මූලාශ්‍ර ලේඛණවල පමණක් සටහන් කරන වට්ටම් වර්ග වනුයේ,
(i) මුදල් වට්ටම් ය. (ii) දුන් වට්ටම් ය. (iii) ලද වට්ටම් ය. (iv) වෙළෙඳ වට්ටම් ය.

21. ව්‍යාපාරයක මූලික පොත් වල සටහන් කරන ගනුදෙනු දෙකක් පහත දැක්වේ.
1. රු. 1,500ක භාණ්ඩ ණයට ගැනිම
2. ව්‍යාපාරයේ විදුලි ගාස්තුව රු. 3,000ක් මුදලින් ගෙවීම,

ඉහත ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරිමේ දී භාවිත කරන මූලාශ්‍ර ලේඛණ වන්නේ,
(i) විකුණුම් ඉන්වොයිසිය හා ගෙවීම් වවුචරය (ii) ගැණුම් ඉන්වොයිසිය හා ගෙවීම් වවුචරය
(iii) ගැණුම් ඉන්වොයිසිය හා ලදු පත (iv) ගැණුම් ඉන්වොයිසිය හා විදුලි ගාස්තු ගිණුම

22. අචිනිගේ ව්‍යාපාරයේ 2024.12.31න් අවසන් වර්ෂය සඳහා පොත් වලින් උපුටා ගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ප්‍රාග්ධනය | රු. 500,000 |
| විකුණුම් ආදායම් | රු. 100,000 |
| කොමිස් ආදායම් | රු. 25,000 |
| වසරට අදාල වියදම් | රු. 50,000 |
| ගැනිලි | රු. 10,000 |

2024.12.31 දිනට අචිනිගේ හිමිකම,
(i) රු. 550,000 (ii) රු. 565,000 (iii) රු. 590,000 (iv) රු. 625,000

23. පහත ගනුදෙනු අතරින් හිමිකම වැඩිවන ගනුදෙනුව තෝරන්න.
(i) රු. 25,000 ක බැංකු ණයක් ගැනීම. (ii) රු. 25,000 ක කොමිස් ආදායමක් ලැබීම.
(iii) රු. 3,800 ක වැටුප් ගෙවීම. (iv) රු. 12,000 ක ලී බඩු මිලදී ගැනීම.

24. 2024.12.01 දිනට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

| වත්කම් | = | හිමිකම් (රු) | + | වගකීම් |
|---|---|---|---|---|
| 50,000 | = | 40,000 | + | 10,000 |

2024.12.01 දින සිදුවූ ගනුදෙනුවකින් පසු ඉහත සමීකරණය පහත පරිදි විය.

| වත්කම් | = | හිමිකම් (රු) | + | වගකීම් |
|---|---|---|---|---|
| 49,000 | = | 39,000 | + | 10,000 |

එදින සිදු වූ ගනුදෙනුව ලෙස සැලකිය නොහැක්කේ,
(i) රු. 1,000ක් ගෙවල් කුලී ගෙවීම ය.
(ii) ව්‍යාපාරයේ මුදල් රු. 1,000ක් අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම ය.
(iii) රු. 5,000ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 4,000කට අත්පිට විකිණීම ය.
(iv) රු. 1,000ක් ණයහිමියන්ට ගෙවීම ය.

25. පහත සමීකරණ අතරින් වඩාත් නිවැරදි සමීකරණය තෝරන්න.

**(i)** ලාභය = ආදායම් + වියදම් **(ii)** හිමිකම = වත්කම් - වගකීම්

**(iii)** වතකම් = හිමිකම් + ප්‍රාග්ධනය **(iv)** වගකීම් = වත්කම් + හිමිකම්

26. පහත දක්වා ඇති ගනුදෙනු අතරින් වත්කම්, හිමිකම් හා වගකීම් යන සියල්ලට ම බලපෑමක් ඇති කරන ගනුදෙනුව තෝරන්න.

**(i)** අයිතිකරු රු. 5,000ක මුදලක් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.

**(ii)** ණයහිමියන්ට රු. 15,000ක මුදලක් ගෙවා දැමීම.

**(iii)** රු. 6,000 ක බැංකු ණය පොලිය ඇතුළුව රු. 50,000ක් බැංකු ණය වාරික ගෙවිම.

**(iv)** ණයගැතියන්ගෙන් රු. 5,000ක මුදලක් ලැබීම.

27. ව්‍යාපාරයක හිමිකම් වැඩිවිමට බලපාන ගනුදෙනුවක් වන්නේ,

**(i)** අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට භාණ්ඩ ගැනීම ය.

**(ii)** රු. 100,000ක් වටිනා යන්ත්‍රයක් මිලදී ගැනීම ය.

**(iii)** රු. 25,000ක විදුලි බිල ගෙවීම ය.

**(iv)** අයිතිකරුගේ වෑන් රථය ව්‍යාපාරයට යෙදවීම ය.

28. නිමල්ගේ ව්‍යාපාරය කමල් සමාගමෙන් රු. 25,000ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට ලබා ගන්නා ලදි. අඩු කළ වට්ටම 10% කි. මෙම ගනුදෙනුවට අදාල නිවැරදි වටිනාකම් සහිත ද්විත්ව සටහන වන්නේ,

(i) ගැණුම් ගිණුම හර රු. 25,000
කමල් ගිණුම බැර රු. 25,000

(ii) කමල් ගිණුම හර රු. 25,000
ගැණුම් ගිණුම බැර රු. 25,000

(iii) ගැණුම් ගිණුම හර රු 22,500
කමල් ගිණුම බැර රු. 22,500

(iii) ගැණුම් ගිණුම හර රු. 25,000
කමල් ගිණුම බැර රු. 22,500
වට්ටම් ගිණුම බැර රු. 2,500

29. සපුමල්ගේ ව්‍යාපාරයේ රු. 10,000ක බඩු තොගයක් ණයට ගැනීමට අදාල ද්විත්ව සටහන වන්නේ,

**(i)** තොග ගිණුම හර රු. 10,000, ණයගැති ගිණුම බැර රු. 10,000

**(ii)** ගැණුම් ගිණුම හර රු. 10,000, මුදල් ගිණුම බැර රු. 10,000

**(iii)** ගැණුම් ගිණුම හර රු. 10,000, ණයහිමි ගිණුම බැර රු. 10,000

**(iv)** මුදල් ගිණුම හර රු. 10,000, ගැණුම් ගිණුම බැර රු. 10,000

30. ව්‍යාපාරයක මූලික පොත්වල හා ලෙජරයේ ගිණුම්වල සටහන් කළ හැකි ගනුදෙනුව වන්නේ,

**(i)** රු. 125,000ක් වටිනා ගොඩනැගිල්ලක් මිලට ගැනීමට අයිතිකරු සමග සාකච්ඡා කිරිම.

**(ii)** රු. 25,000ක මාසික වැටුපකට සේවකයකු බඳවා ගැනිම.

**(iii)** රු. 2,000ක භාණ්ඩ අයිතිකරු ගැනිලි ලෙස ලබා ගැනීම.

**(iv)** රු. 75,000ක බැංකු අයිරාවක් බැංකුව විසින් අනුමත කිරිම.

❖ පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්ණ අංක 31 හා 32 ට පිළිතුරු සපයන්න.

අනුරගේ ව්‍යාපාරයේ රු. 30,000 ක පිරිවැය වු භාණ්ඩ තොගයක් සෙනුරගේ ව්‍යාපාරයට රු. 40,000 ට ණයට විකුණන ලදි. ණය ආපසු ගෙවීමේ දි ණය මුදලින් 10% ක වට්ටමක් ලබා දී ඇත.

31. ඉහත ගනුදෙනුව නිසා අනුරගේ ව්‍යාපාරයට ලද ලාභය කොපමණ ද ?

(i) රු. 40,000 කි. (ii) රු. 10,000 කි. (iii) රු. 6,000 කි. (iv) රු. 4,000 කි.

32. සෙනුරගේ ව්‍යාපාරයේ මුදල් ගෙවීම සම්බන්ධ නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

(i) ණයහිමි ගිණුම හර රු. 40,000
මුදල් ගිණුම බැර රු. 40,000

(ii) ණයහිමි ගිණුම හර රු. 36,000
මුදල් ගිණුම බැර රු. 36,000

(iii) ණයහිමි ගිණුම හර රු. 40,000
මුදල් ගිණුම බැර රු. 36,000
ලද වට්ටම් ගිණුම බැර රු. 4,000

(iv) ණයහිමි ගිණුම හර රු. 40,000
මුදල් ගිණුම බැර රු. 36,000
දුන් වට්ටම් ගිණුම බැර රු 4,000

33. රසාංගගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රීමය රු. 5,000 කි. 2024.11.01 දිනට සුළු මුදල් භාරකරු සතුව රු. 600 ක් තිබුණි. නොවැම්බර් මස සිට අග්‍රීමය රු.6,000 දක්වා වැඩි කිරිමට ව්‍යාපාරය තීරණය කරන ලදි. නොවැම්බර් 01 දිනට ප්‍රතිපූර්ණය කිරිමට අදාල මුදල වන්නේ,

(i) රු. 6,000 (ii) රු. 5,400 (iii) රු. 5,000 (iv) රු. 4,400

❖ ප්‍රශ්ණ අංක 34 සඳහා පහත තොරතුරු ඇසරෙන් පිළිතුරු සපයන්න.

සුරංගගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 8,000 කි. 2024 ජනවාරි මාසයේ සුළු මුදල් විශ්ලේෂණ තීරුවල ශේෂ පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ගමන් වියදම් | රු. 1,800 | තැපල් වියදම් | රු. 2,000 |
| ලිපිද්‍රව්‍ය | රු. 1,200 | විවිධ වියදම් | රු. 2,300 |

34. සුරංගගේ ව්‍යාපාරයේ 2024 ජනවාරි මාසයේ සුළු මුදල් වියදම කොපමණද ?
**(i)** රු. 2,000 කි. **(ii)** රු. 2,300කි. **(iii)** රු. 7,300 කි. **(iv)** රු. 8,000 කි.

35. සුළු මුදල් "අග්‍රිමය ප්‍රතිපූරණය" යනුවෙන් අදහස් වන්නේ,
**(i)** කාලච්ඡේදයට අයත් මුදල ලබා දීම
**(ii)** කාලච්ඡේදයේ වියදම් කල මුදලට සමාන මුදලක් ලබා දීම.
**(iii)** කාලච්ඡේදයේ ඉතිරි මුදලට සමාන මුදලක් ලබා දීම.
**(iv)** කාලච්ඡේදයේ ඉල්ලුම් කරන මුදල් ප්‍රමාණය ලබා දීම.

36. වෙළෙඳ ව්‍යාපාරයක් විසින් එකක් රු. 400 බැගින් කිරිපිටි පැකට් 50ක් 10% ක වෙළෙඳ වට්ටමකට යටත්ව ණයට ගන්නා ලදි. මාසයකට පෙර මුදල් ගෙවන්නේ නම් 5% ක වට්ටමක් දෙනු ලැබේ. ගැණුම් ජනලයේ සටහන් කරන වටිනාකම කොපමණ ද?
**(i)** රු. 17,100 **(ii)** රු. 18,000 **(iii)** රු. 19,000 **(iv)** රු. 20,000

37. කලනිගේ ව්‍යාපාරයේ 2024 අගෝස්තු මාසය සඳහා පිළියෙළ කළ ගැණුම් ජ'නලය පහත පරිදි විය.

ගැණුම් ජ'නලය

| දිනය | ඉ.අ. | සැපයුම්කරු | වටිනාකම | ලෙ.පි. |
|---|---|---|---|---|
| 8/15 | 19 | චමිල | 75,000 | |
| **A** ..... | | **B** ..... | 75,000 | |

ඉහත **A** හා **B** හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු කාණ්ඩය වන්නේ,
**(i)** 8.15 චමිලගේ ගිණුමට හර කලා **(ii)** 8.15 ගැණුම් ගිණුමට හර කලා
**(iii)** 8.31 චමිලගේ ගිණුමට හර කලා. **(iv)** 8.31 ගැණුම් ගිණුමට හර කලා.

38. පොදු ජනලයේ සටහන් කළ යුතු ගනුදෙනුවක් වන්නේ,
**(i)** රු. 5,000ක ට ණයට භාණ්ඩ ගැනිම ය.
**(ii)** රු. 12,500 ලී බඩු නිමල්ගෙන් ගැනීම.
**(iii)** රු. 7,500ක භාණ්ඩ අත්පිට මුදලට විකිණීම.
**(iv)** රු. 5,700ක යන්ත්‍රයක් කසුන්ගෙන් අත්පිට මුදලට ගැනීම.

39. බැංකු ප්‍රකාශණයේ දැක්වෙන ශේෂය හා ව්‍යාපාරයේ බැංකු ගිණුමේ පවතින ශේෂය අතර වෙනසට බල නොපාන හේතුව වන්නේ,
(i) රු. 2,000 ක බැංකු ගාස්තුවක් අයකර තිබිම.
(ii) රු. 8,000 ක ණය ගැතියෙකු සෘජුවම බැංකුවට මුදල් එවිම.
(iii) රු. 5,000 ක ණයහිමියෙකුට නිකුත් කළ චෙක්පතට බැංකුව ගෙවීම් කිරිම.
(iv) රු. 6,000 ක තැන්පත් කළ චෙක්පත බැංකුව ගිණුමට බැර නොකිරිම.

40. ව්‍යාපාරයක 2024.01.01 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 15,500 ක් වු අතර, එදිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු. 16,000 ක් විය. මෙම වෙනසට හේතු වන ගනුදෙනුව තෝරන්න.
(i) බැංකුව විසින් අයකර ගත් රු. 500 ක බැංකු ගාස්තු
(ii) බැංකුවට සෘජුවම ලැබී තිබු ආයෝජන ආදායම රු. 500
(iii) ස්ථාවර නියෝග මත බැංකුව අයකර ගත් රු. 500ක රක්ෂණ වාරික.
(iv) තැන්පත් කළ නමුත් නිශ්කාශණය නොවු චෙක්පත් රු. 500

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.